## 04. ව්‍යාපාර

**“ මුදල් වර්ධනයට නිසි ඉපයීම් මාර්ග සොයමු ”**

එදිනෙදා ජීවත් වීමේ දී අපට අවශ්‍ය මුදල් ඇතුළු සියළු සම්පත් ( ආහාර, ඇඳුම් පැලඳුම්, විදුලිය, දුරකථන ආදිය ) අරපිරිමැස්මෙන් හා මනා පාලනයකින් යුතුව පරිභෝජනය කිරීම තුළින් ඉතිරි කිරීම් ගොඩනැගේ. සෑම ඉතිරිකිරීමක් ම අවසානයේ දී මුදල් ඉතිරිකිරීමකට මඟ පෑදේ. එසේ ඉතිරි කරගත් හා සපයා ගත් මුදල් නිවෙස්වල ම තබා නොගෙන වෙනත් ඉපයීම් මාර්ගවල යෙදවීමෙන් අමතර ආදායම් උපයා ගත හැකිය.

බැංකු සහ වෙනත් මූල්‍ය ආයතනවල මුදල් ඉතිරි කිරීමෙන් ද පුද්ගලයෙකුට අමතර ආදායමක් ඉපයීමට හැකි වේ. පොළී ආදායමක් එමඟින් ලැබිය හැකි අතර අවශ්‍ය වේලාවක ඉතිරි කළ මුදල් ආපසු ලබා ගැනීමේ පහසු මාර්ගයක් ලෙසද හඳුනාගත හැකිය.

1. මුදල් තැන්පත් කිරීම තුලින් අමතර ආදායමක් ලෙස පොලී ආදායම් ලබා ගත හැකි මූල්‍ය ආයතන කිහිපයක් නම් කරන්න.

2. ඔබ සහ ඔබගේ පවුලේ අයගේ ඉතුරුම් මුදල් තැන්පත් කරන ආයතන මොනවාද ? එම ආයතන මඟින් ඔබට සහ ඔබ පවුලේ අයට සැපයෙන සේවාවන් නම් කරන්න.